# කවි කොළය

## පුටුවේ අටුවාව

කෙනෙකුට දුකක් කරදරයක් වෙනු  දුටුව
මොහොතෙහි පස්ස රත්වී උඩ පැන  නැටුව
සක් රජතුමාගේ සයිලාසන  පුටුව
මළකඩ කා තිබේ බණ පොතටම  කොටුව

වසවත් මාරයා මර දූවරු  කැටුව
වෙහෙසුණ නමුත් බිඳ රාගයෙ බල  කොටුව
මහබෝසත්හු පළවා හැර මිස  දිටුව
බුදුබව ලැබූ මත වජ්රාසන  පුටුව

නා සොහොයුරන් දෙදෙනෙකු පොරකනු  දුටුව
බුදුහිමි කැළණියට වැඩ පිරිවර  කැටුව
නවතා සටන කළ මෙහෙවර ගැන  තුටුව
බුදුනට පිදි ඒ මිණි සිහසුන  පුටුව

පෙර එක් මෝඩ ගැමියෙකු කඩමින්  අටුව
ජනවහරේ තිබේ තැනු පුවතක්  පුටුව
යසලාලකගෙ බෙල්ලට කඩුවෙන්  කෙටුව
සුබ රජ වුණා පුටුවේ මහිමය  දුටුව

ජාතික නිදහසට ගසමින් විස  කටුව
සිංහළ රාජ වංශයෙ හිරකළ  බොටුව
සුද්දා පැහැරගත් අන්තිම රජ  කැටුව
කටුගෙයි දුක කියයි සිංහාසන  පුටුව

ජීවිත පොතේ පෙරලූ අන්තිම  පිටුව
එල්ලුම් ගහ වගේ අප වැලිකඩ  දුටුව
ගෙනගිය පරලොවට මිනිමරුවන්  කැටුව
නිහඬය ඇමරිකාවෙත් විදුලිය  පුටුව


බලයක් නොමැත ගරු නම්බුව මිස  දුටුව
නැත සත පහකවත් යම් මෙහෙයක්  ඉටුව
පින පළදෙමින් මහ බඹු නළලෙහි  කෙටුව
වැජඹේ සව් ඉසුරු ලැබ අගමැති  පුටුව

නායකතුමාගේ මිරිකන්නට  බොටුව
කරුලා, සජිත්ලා තව තව අය  කැටුව
කෙරුවත් හොරෙන් තැන් තැන්වල කටු  කුටුව
උදුරාගන්න බැරිවිය නායක  පුටුව



යුගයක් නිමා කරමින්
යුද අවි  ගැටුව
වසරක් පුරා දන්දෙන
ජනදුක  දුටුව
පැරදූ අනේපිඬු නම්
ලද මහ  සිටුව
සැරදේ! සියක් වසරක්
ජනපති  පුටුව!

♦ තලන්ගම ජයසිංහ
Sri Lanka



මේ පින්තූරයේ දැක්වෙන්නේ දකුණු පස ශෝක ප්‍රකාශයට වසර 4 කට කලින් සිදු වූවකි. 1948 පෙබරවාරි 4 වන දින ලංකාවට නිදහස ලැබී කොළඹ ප්‍රථම නිදහස් උත්සවය පවත්වා මසකට පසු ශ්‍රීලංකාවේ ප්‍රථම අගමැති ඩී. එස්. සේනානායක මහතා ලන්ඩනයට පැමිණියේය. ලන්ඩනයේ එකල ඉගෙනගත් ශ්‍රීලංකා ශිෂ්‍යයෝ ද නිදහස සමරණ උත්සවයක් ලන්ඩනයේ ද සංවිධානය කළෝ ය. එයට පැමිණි අගමැති තුමා පහන දැල්වූ ආකාරයයි මේ. ඉදිරියෙන් දකුණු පස ඒ දෙස ඉතා ඕනෑකමින් බලා සිටින තරුණයා එදා ශ්‍රීලංකා ශිෂ්‍ය සංගමයේ සභාපති වූ මේ මැතක අභාවප්‍රාප්ත තිස්ස විජේරත්න මහතා ය.



# පැරණි ශෝක ප්‍රකාශයක්

**1952** මාර්තු **22** දින ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ඩී. ඇස්. සේනානායක මැතිතුමා අභාවප්‍රාප්ත වන විට මා අවුරුදු අටක පමණ දරුවෙකි. මගේ පියා සමග මමද එම ආදාහන උත්සවය පැවති නිදහස් චතුරශ්‍රයට ගිය මට යන්තම් එම සිදුවීම අදත් මගේ මතකයට නැගේ.

එදා ආදාහන සභාවේ එතුමාගේ ගුණ වනා බෙදා හරින ලද ශෝකප්‍රකාශ කීපයක් ද මපියාණන් ගෙනැවිත් අල්මාරියක ලිපිගොණු අස්සේ දමා තිබී අඩක් විනාශ වී ගිය එක් ශෝක ප්‍රකාශයක කවි තුනක් පමණක් මට හමුවිය. එය ඔබ ලංකාවිත්ති පුවත් පතේ පාඨකයන්ගේ අවධානය පිණිස එවන්නට මට සිතුණි. එහෙත් අවාසනාවට මෙන් එම කවි කොළයේ රචකයාගේ නම සඳහන් කොටස විනාශ වී ගොස් තිබුණි. මේ කවි වලින් ද්වනිත වන්නේ එදා අප රටේ ජනතාවගේ අවංක හැඟීම් ය. මේ කවි තුන කොතරම් සංවේදීදැයි බලනු මැනවි.



ඩී. ඇස්. සේනානායක මැතිතුමා

✻
ගොවියෙකු ලෙස ඉපිද ටික ටික ඉහළ  නැග
පත්වූ රටේ මහමැති පදවියට  අග
සිහිවී සේනනායක මැතිසඳුගෙ  වග
දෙනෙතින් ගලාගෙන යයි උණු කඳුළු  ගඟ

✻
රට ජාතිය දෙකට කළ නොනැසෙන  සේවේ
පොඩි ළමයෙකු පවා හඳුනයි හෙළ  දූවේ
වීරය ! ඔබේ සිහිකර ගුණ යමුනා  වේ
ජාතිය තවම පිහිනා ගිලි ගිලි  නැවේ

✻
ගල්ඔය මිණිපෙ ඇලහැර ලක්බිමට  තියා
නොනැසෙන නමක් රන් ඉතිහාසයෙහි  ලියා
ඩී. එස්. සේනනායක ජාතියෙහි  පියා
සුරලොව මහා අගමැති පදවියට  ගියා

♦ හැමිල්ටන් අතපත්තු
වීදාගම - බණ්ඩාරගම Sri Lanka



**ඉරිදා** - පෙරේදා ලොකු නංගිට කතාකරපු වෙලාවෙ තමයි
**SUN** දැනගත්තෙ තලවකැලේ නැන්දම්මා ආසිරි එකට ඇතුල් කරලා ප්‍රෙෂර් වැඩිවෙලා. නැන්දම්මා කිසිදෙයක් කන්නෙ නැතිලු. සති දෙකකට වැඩියි සේලයින් දෙනවයි කිව්වා. රෝහණයි චූටියි දෙන්නා ගිහින් එතන වාට්ටුව බාර දොස්තර හම්බවෙලා නැන්දම්මගෙ ලෙඩේ ගැන අහලා තියනවා. පවුලෙ අය විස්තර අහන්නෙ දන්නෙ නැති නිසා නේ. දොස්තරට කේන්ති ගිහිල්ලා විස්තර ඇහුවයි කියලා. දැන් ලංකාවෙ සේරම දොස්තරලා එහෙමයි. ලෙඩෙක් හරි ලෙඩාගෙ නෑයෙක් හරි ලෙඩේ ගැන ඇහුවොත් තදවෙනව ඇඟට කඩාපනිනවා. ලෙඩා මැරුණොත් ඒකට හේතුව කියන්නෙත් නැහැ. ඒඅතින් මෙහේ දොස්තරලා කොච්චර හොඳද කියලා හිතෙනවා. කරුණු පහදලා දෙනවා. ඒ ඒ පවුලෙ කට්ටියට කරුණාවෙන් කතා කරනවා.

**සඳුදා** - දැන් ඉන්දියාව සෑහෙන්න බයෙන් ඉන්නෙ චීනෙ
**MON** ගැන. චීනෙත් එක්ක කවුරු හරි රටක් වැඩිය ආශ්‍රය කරනවා නම් ඉන්දියාවට ඒක අල්ලන්නෙ නෑ. ළඟදි අපේ ලංකා හමුදා පතිවරයා ඉන්දියාවට ගියාම ඉන්දියාව අහලා තියනවා ඇයි ඕගොල්ලො චීනෙ එක්ක ඔච්චර කිට්ටුවෙන් ආශ්‍රය කරන්නෙ කියලා. අපේ හමුදා පති කිව්වලු ඒ චීන්නු නරක මිනිස්සු නෙවෙයි, කවුරුවත් යටත් කරගන්න හිතන් ඉන්න මිනිස්සු නෙවෙයි. අපිට හරියට උදව්කරලා තියනවා. දැනුත් උදව්කරනවා. අපිට නම් නරකක් පේන්නෙ නෑ කියලා. ඇයි එහෙම ඇහුවෙ ? කියලා ඇහුවම කිව්වලු, " නෑ නිකම් ඇහුවෙ " කියලා. අවුරුදු ගණනකට ඉස්සර ඉන්දියාව චීනෙත් එක්ක ලොකු යුද්ධයක් කළා. ඉන්දියාවට තවම ඒක මතකයි.

**කුජදා** - මේ ළඟදි ලන්ඩන් ටෛම්ස් පත්තරේ තිබුණා
**TUE** ආසියානු රටවල කෑම පිළියෙල කරන්න ගන්න තුනපහ වල පිළිකා විනාසකරන ගුණ තියනවයි කියලා. තුනපහ පාවිච්චිය මුළු ලෝකෙටම හරි හොඳය කියලා තිබුණා. විශේෂයෙන් ඒ තුනපහ වලට ගන්නා කහ වල පිළිකා බීජය නසන මහා බලයක් ඇති බව විද්‍යාඥයො සොයාගෙන තියනවලු. ඒක නම් පට්ටපල් බොරුවක්. ලංකාවෙ වෑංජන වලට කහ දාන්නෙ අද ඊයෙද? අවුරුදු දහසකට කිට්ටු කාලයක් තිස්සෙ. කහ වලින් නොකරන දෙයක් නැහැ. කහනූල් අතේත් බෙල්ලෙත් බඳිනවා.කතාව ඇත්ත නම් මහරගම පිළිකා රෝහලක් තියෙන්න බෑ.

**බුදදා** - ටියුඩර් නන්දනී දෙන්නා ලංකාවෙ ලොකු ඉඩමක්
**WED** ගත්තා කාලෙකට ඉස්සර වෙලා. ගේ කුත් හැදුවා. ඒකට වැටවල් ගැහුවා. ලන්ඩන්වල ජෝන් ලුවිස්, ඩෙබන් හැම්, සෙල්ෆ්රිජ් සාප්පුවලින් දොරරෙදි, ඇඳන්රෙදි සේරම ගෙනිච්චා. විසාල ඩිජිටල් ටීවී සෙට් එකකුත් ගෙනිච්චා. " විශ්‍රාම ගියාම අපිට නිවීහැනහිල්ලෙ ලංකාවට ගිහිං ඉන්නයි, අපේ ළමයි තුන්දෙනා මෙහේ ඉඳලා එහේ ගියාම නිවාඩුව ගත කරන්නයි, සේරටම තමයි ගේ හැදුවෙ " කිව්වා. නිහාල් නන්දනී දෙන්නම දැන් වැඩකරන්නෙ නැහැ, රිටයර් වෙලා. නන්දනී දැන් කියනවා ලංකාවට යන්න බැහැ කියලා. " ළමයි එහේ හොලිඩේ ගියත් හෝටල්වල ඉන්නයි ආස. මොකටද මං මෙච්චර වියදම් කරලා ගේ හැදුවෙ ? " කියලා ටියුඩර් දැන් දුක් වෙනවා.

**ගුරුදා** - ලංකාවට සෙනසුරු ග්‍රහය ලබනවය ඒ නිසා
**THU** ඒ අපලවලින් බේරෙන්න කියලා මැති ඇමතිවරු මේ දවස්වල යන්තර බඳිනවලු නිල්පාට ගල් අල්ලපු මුදු අතේ පළඳිනවය කියලා පත්තරවල තිබුණා. ඇමති මර්වින් සිල්වා බුරුමෙන් වටිනා මුද්දක් ගෙන්නගන සෙනසුරාට බයේ පළඳගෙන ඉන්න බව මෑන්ම පත්තරකාරයෙකුට කියලා තිබුණා. සෙනසුරාටත් වැඩිය මර්වින් තමයි ලංකාවට තියන ලොකුම අපලෙ කියලා මිනිස්සු කියනවා.

**කිවිදා** - ලකාවෙ මේ දවස් වල කවුරුත් කතා කරන්නෙ
**FRI** අලුත හදපු වේගවත් පාර ගැන. ඒ අධිවේගී පාරෙ කොළඹ ඉඳලා පැය එකහමාරකින් මාතරට යන්න ඇහැකිලු. වෙනදා පැය තුන හමාරක් ගිය ගමන දැන් බාගෙ වෙලාලු. බය තියෙන්නෙ මාරක රිය අනතුරු ගැන. මම අපේ මිනිස්සු වාහන එළවන හැටි දැකලා තියනව නේ. ඒ අධිවේගී පාරෙන් කමක් නැහැ. ලංකාවට ගියාම මම යන්නෙ පරණ විදියට බස්වල. දන්න පරණ ගොඩතරේ පාරවල් වලින් දවස් දෙක තුනක් ගියත් කමක් නෑ අත පය බේරගෙන මාතරට ගියොත් මට ඒ ඇති.

**ශනිදා** - අධිවේග පාරෙ වාහන පදවන අයට විශේෂ වේග
**SAT** නීතියක් දාලා තියනවා. පැ. කි. මී. 100 කට වැඩිය යාම තහනම්. ගියොත් එය දඩුවම් ලබන වරදක්. විවෘත කළ දවසෙම ඒ මූලික නීතිය කැඩුවෙ කවුරුවත් නෙවෙයි ලංකාවෙ ප්‍රවාහන ඇමතිමයි. ඇමති නිමල් වෙල්ගම එයාගෙ කටින්ම පුවත්පත් වාර්තාකරුවන්ට මෙහෙම කිව්වා. " අධිවේගී පාර නියමයි. උදේ මම පැගුවා 250 ට. කිසි ගාණක් නෑ. බබා වගේ ගියා....." නීතිය 100 නම් එයා 250ට පැගුවෙ කොහොමද? පොලීසිය ඇල්ලුවෙ නැද්ද ? දැන් හැමෝම බලන් ඉන්නෙ ඇමතිට ඒ වරදට දඩයක් ගහවිද කියලා. ඒ ලංකාවෙ හැටි. ලොකු ලොක්කන්ට ඕනම නීතියක් කඩන්න පුළුවන්. සාමාන්‍ය ජනයට බෑ.